
# ස්ථිරසාර ස්ථායිතාව

## වාර්ෂික ආර්ථික විවරණය 2023

ශ්‍රී ලංකා මහ බැංකුව
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව | 2024 මැයි 7




## ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 සැප්තැම්බර් මාසයේ දී බලාත්මක කරන ලදී

ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම **මහ බැංකුවේ ස්වාධීනත්වය** සහ **වගවීම** ඉහළ නැංවීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය

## 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ *80(3) වන වගන්තිය*

මහ බැංකුව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් **මාස හතරක කාලසීමාවක් ඇතුළත** **තම ප්‍රතිපත්තිමය අරමුණු සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින්**, ඒ මුදල් වර්ෂය තුළ **ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව** පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද **වාර්තාවක් ප්‍රසිද්ධ කර, එය මුදල් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට** මහ බැංකුවේ අධිපතිවරයා විසින් වගබලා ගත යුතු ය

# 2023 වාර්ෂික ආර්ථික විවරණයෙහි ඇතුළත් වන්නේ...

මූලික ආර්ථික දර්ශක

මූලික සමාජ දර්ශක

සමස්ත සාරාංශය

පරිච්ඡේද

1: සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය

2: මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

3: සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග


විශේෂ සටහන් (7)

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය (20)

[සංඛ්‍යා සටහන් 142ක් මාර්ගගතව Excel පැතුරුම්පත් ආකෘති මගින් ලබා ගත හැකි අතර ඒවායේ පෙර වර්ෂයන් සඳහා වැඩිදුර දත්ත ඇතුළත්ය]

විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය (9)


[සංඛ්‍යා සටහන් 11ක් මාර්ගගතව Excel පැතුරුම්පත් ආකෘති මගින් ලබා ගත හැකි අතර ඒවායේ පෙර වර්ෂයන් සඳහා වැඩිදුර දත්ත ඇතුළත්ය]




වාර්ෂික ආර්ථික විවරණයේ මහ බැංකුවේ ප්‍රතිපත්ති අරමුණු සහ 2023 වසර තුළ මහ බැංකුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් මෙන්ම මූල්‍ය පද්ධතියේ තත්ත්වය ඇතුළත් වේ




මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වෙනම ප්‍රකාශනයකින් ඉදිරිපත් කර ඇත





# සාර්ව ආර්ථික ප්‍රවණතා, මූල්‍ය පද්ධතියේ තත්ත්වය සහ මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

# රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද තීරණාත්මක ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් සාර්ව ආර්ථික ස්ථායිතාව යළිත් බොහෝ දුරට ස්ථාපිත කිරීම සඳහා සහාය සැපයිණි...

- ශීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලිය සමඟ උද්ධමනය පාලනය විය
- විනිමය අනුපාතිකයේ ස්ථාවර බව ශක්තිමත් විය
- දළ නිල සංචිත වැඩි වූ අතර එමගින් අත්‍යවශ්‍ය වූ විදේශීය ස්වාරක්ෂක ගොඩනැගුණි
- අර්බුද සඳහා ඉහළ පෙර සුදානම තුළින් මූල්‍ය අංශය සිය ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කළේය
- රාජ්‍ය මූල්‍ය අංශය ඉතා යහපත් වර්ධනයක් පෙන්වීය
- යථා තත්ත්වයට පත් වූ ස්ථායිතාවයේ ප්‍රතිලාභ ලබමින් ආර්ථිකය වර්ධන මාවතක් කරා යොමු විය

# උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසගත ඉහළම අගය වාර්තා කළ අතර, එතැන් සිට සීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලියකින් අනතුරුව, 2023 වසර අවසානය වන විට අඩු තනි අගයක මට්ටමක් දක්වා පහළ ගියේය...

**මතුපිට උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලික උද්ධමනය ද 2023 වසරේ දී සැලකිය යුතු නිර්-උද්ධමනයක් වාර්තා කළේය

**දේශීය මිල ස්ථායිතාව යථා තත්ත්වයට පත්වීම සඳහා ප්‍රධාන වශයෙන් පහත කරුණු සහාය විය:**


- දැඩි මුදල් තත්ත්වයන් මෙන්ම දැඩි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග
- දේශීය සැපයුම් තත්ත්ව යථා තත්ත්වයට පත් වීම
- ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම
- ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම

**උද්ධමන ඉලක්කය**

ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමෙන් පසුව, මහ බැංකුව වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 5%ක මට්ටමෙහි පවත්වා ගැනීමට අපේක්ෂා කරයි

# මිල ස්ථායිතාව යථා තත්ත්වයට පත් වීමෙන් පසුව, 2023 වසරේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් ලිහිල් විය...

## ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරන ලදී...





### 2023 වසරේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී

- උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වීම හා උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීම
- දේශීය ආර්ථිකයේ අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ පහළ ගිය ආර්ථික ක්‍රියාකාරකම්
- විදේශීය අංශයේ පීඩන ලිහිල් වීම

# වෙළඳපොළ පොලී අනුපාතික 2022 වසරේ වාර්තා වූ ඉහළම මට්ටම්වල සිට 2023 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය...

## වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය...





2023 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙම පොලී අනුපාතික අඩු වීම සඳහා හේතු විය

**අධික ලෙස ඉහළ මට්ටමක පැවති ණය පොලී අනුපාතික අඩු කිරීම සඳහා සහාය වූ සාධක:**


- වෙළඳපොළ පොලී අනුපාතික අඩු කිරීම ඉලක්ක කරගත් නියාමන ක්‍රියාමාර්ග හා ශිෂ්ය ප්‍රයෝග
- දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික හා සම්බන්ධ අවදානම් අධිමිල අඩු වීම

# බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් වැඩි වීම මධ්‍යයේ වුව ද, 2023 වසරේ දී පුළුල් මුදල් සැපයුමේ (M2b) වර්ධනය අඩු මට්ටමක පැවතිණි...

**මුදල් ප්‍රසාරණය අඩු මට්ටමක පැවතිණි...**





**බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස**




- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2023 ජූනි මාසයේ දී ඉහළ යැමත් සමඟ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය මාසිකව සංකෝචනය වීමේ දීර්ඝතම කාල සීමාව අවසන් විය
- රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2023 වසරේ දී සංකෝචනය විය
- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය
- මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසර තුළ දී රුපියල් බිලියන 1,056.3ක සංකෝචනයක් වාර්තා කරන ලදී.
- බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් 2023 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය

# ශ්‍රී ලංකා ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමේ සළකුණු 2023 වසරේ දෙවන භාගයේ දී පෙන්නුම් කළේය...




පොලී අනුපාත ලිහිල් කිරීම සහ විදේශීය අංශයේ අවහිරතා ලිහිල් වීම මධ්‍යයේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යළි වැඩිදියුණු වීම මෙම යථා තත්ත්වයට පත්වීම සඳහා හේතු විය

# වියදම් ප්‍රවේශය සලකන විට, පවත්නා මිල අනුව ආර්ථිකයේ සමස්ත ඉල්ලුමේ වර්ධනය සඳහා දේශීය මෙන්ම විදේශීය ඉල්ලුම ද ධනාත්මක දායකත්වයක් දක්වා ඇත...

## වියදම් ප්‍රවේශය අනුව 2023 වසරේ පවත්නා මිල අනුව ද.දේ.නි.:

- මිල මට්ටම්වල බලපෑම හමුවේ පෞද්ගලික මෙන්ම රජයේ පරිභෝජන වියදම් ඉහළ යෑම හේතුවෙන් **පරිභෝජන වියදම 2023 වසරේ දී සියයට 16.7කින් වර්ධනය විය.**
- වසර තුළ දී **ආයෝජන වියදම ඉහළ ගිය** ද, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් වියදම පහත වැටීම හේතුවෙන් ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පහත වැටුණි.
- භාණ්ඩ හා සේවා ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව තිබිය දී භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ යෑම හේතුවෙන් **ශුද්ධ විදේශීය ඉල්ලුම සියයට 51.9ක සැලකිය යුතු ලෙස වර්ධනයක්** වාර්තා කළේය.

| | 2023 |
|---|---|
| දේශීය ඉතුරුම් (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ) | 23.8 |
| ජාතික ඉතුරුම් (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස) | 27.2 |

# සේවා වියුක්ති අනුපාතිකය, පෙර වසර හා සැසඳීමේ දී 2023 වසරේ දී සියයට 4.7ක අගයෙහි නොවෙනස්ව පැවතුණි...

**1.6 සංඛ්‍යා සටහන** කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය

| ශීර්ෂය | 2022 | 2023 (අ) |
|---|---|---|
| කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000 (ආ) | 17,162 | 17,306 |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | 8,547 | 8,408 |
| සේවා නියුක්ත | 8,148 | 8,010 |
| සේවා වියුක්ත | 399 | 398 |
| සේවා වියුක්ත අනුපාතිකය | 4.7 | 4.7 |
| පුරුෂ | 3.7 | 3.6 |
| ස්ත්‍රී | 6.5 | 7.0 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ) | 49.8 | 48.6 |
| පුරුෂ | 70.5 | 68.6 |
| ස්ත්‍රී | 32.1 | 31.3 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස


- වසර තුළ දී සේවා වියුක්ත ජනගහනය සහ ශ්‍රම බලකාය යන දෙ අංශය ම අඩුවීමෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2023 වසරේ දී සේවා වියුක්ත අනුපාතිකය නොවෙනස්ව පැවතුණි

- තවද, පෙර වසරේ මිලියන 8.148ක් ලෙස වාර්තා වූ සේවා නියුක්ත ජනගහනය 2023 වසරේ දී මිලියන 8.010ක් දක්වා අඩුවිය


- විදේශ සේවා සඳහා පිටත්ව යෑම 2023 වසරේ දී ඉහළ මට්ටමක පැවති නමුත්, 2022 වසරට සාපේක්ෂව එහි අඩු වීමක් වාර්තා විය

# 2023 වසරේ දී විදේශීය අංශය බොහෝ ක්ෂේත්‍රයන් ඔස්සේ සැලකිය යුතු ලෙස වර්ධනය විය...

## ජංගම ගිණුමේ ශේෂය




## දළ නිල සංචිත




### 2023 වසරේ දී වාර්තා වූ ජංගම ගිණුමේ අතිරික්තයට හේතු වූයේ...

- අඩු වෙළඳ හිඟය
- ඉහළ සංචාරක ඉපැයීම් සහ
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ


### 2023 වසර අග දී සංචිත දෙගුණයකටත් වඩා වැඩි වීමට හේතු වූයේ...

- මහ බැංකුව විසින් ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම
- ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සහ
- ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යනයන්

**විදේශීය අංශයේ ස්ථායිතාව ඉහළ යාමෙන් අනතුරුව, මහ බැංකුව සහ රජය විසින් 2023 වසරේ දී විදේශ විනිමය සීමා කිරීම්, ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ පියවර සහ ආනයන සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කරන ලදී.**

# ආනයනවල සැලකිය යුතු අඩුවීම හේතුවෙන් වෙළඳ හිඟය පහත වැටුණි...

## අපනයන සංයුතිය





**2023 වසරේ දී අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 11,911ක් දක්වා සියයට 9.1%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහත වැටුණි**

අපනයනවල පහළ යෑම සඳහා අපනයන මිල දී ගන්නා ප්‍රධාන රටවල ජීවන වියදම ඉහළ යෑම, ආර්ථික අවපාත ඇතිවීම සහ භූ-දේශපාලනික ගැටලු හේතු විය


## 2023 වසරේ දී වෙළඳ හිඟය 2010 සිට පැවති අවම අගය දක්වා අඩු විය

## රට අනුව වෙළඳ ශේෂයන්




**2023 වසරේ දී අඩු වූ මුළු වෙළඳාමට අනුකූලව බොහෝ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික වෙළඳාම සැලකිය යුතු ලෙස පහත වැටුණි**

## ආනයන සංයුතිය




**2023 වසරේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,811 දක්වා සියයට 8.1%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහත වැටුණි**

අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම්, ආර්ථිකයේ ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන වියදම පහළ ගියේය

# වෙළෙඳපොළ පදනම් කරගත් විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් යටතේ ශ්‍රී ලංකා රුපියල 2023 වසරේ දී තියුණු ලෙස අතිප්‍රමාණය විය...

## විනිමය අනුපාතිකය





## ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

අලුතින් පනවන ලද **2023** වසරේ අංක **16** දරන මහ බැංකු පනතට අනුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව **නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක්** ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

- මහ බැංකුව 2023 වසරේ දී **නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක්** අනුගමනය කළේය
- විදේශ විනිමය ගනුදෙනු සඳහා පනවා ඇති සීමාවන් ක්‍රමයෙන් ඉවත් කරන ලදී

# අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ සමස්ත මූල්‍ය අංශයේ ස්ථායිතාව පවත්වා ගෙන යන ලදී...




# මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග...




- ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් සාර්ව විචක්ෂණශීලී අධිකාරිය ලෙස මහ බැංකුව නම් කරන ලදී
- බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයන්ට අදාළ ගැටලු විසඳීම සඳහා ක්ෂුද්‍ර විචක්ෂණ ක්‍රියාමාර්ග කිහිපයක් ද ක්‍රියාවට නංවන ලදී
- බලපත්‍රලාභී බැංකු තම අභිමතය පරිදි සිදුකරන ගෙවීම් සීමා කිරීම සඳහා බැංකු පනත් විධිවිධාන හඳුන්වා දෙන ලදී
- බලපත්‍රලාභී මුදල් සමාගම්වල ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම් අනුමත කිරීමේ කාර්යාවලිය විධිමත් කිරීමේ අරමුණින්, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම සහ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී
- බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙළ, මැදිකාලීනව ශක්තිමත්, ගතික සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් බිහි කරනු ඇත
- අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයන් ආරක්ෂා කිරීමේ අරමුණින් සහන ක්‍රියාමාර්ග ගන්නා ලෙස බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් යන අංශවලින් ඉල්ලා සිටින ලදී
- ගනුදෙනු සහ ප්‍රේෂණ සඳහා විද්‍යුත් මුදල් සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී
- මූල්‍ය සේවා සපයන්නන් සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ නියාමන හඳුන්වා දෙන ලදී
- මහ බැංකු පනත මගින් බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල නිරාකරණ අධිකාරිය බවට මහ බැංකුව පත් කරනු ලැබීය

# දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මගින් 2023 වසරේ සුවිශේෂී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් ඇති කරමින් ප්‍රධාන මූල්‍ය ශේෂයන් සැලකිය යුතු ලෙස වර්ධනය විය...


## රාජ්‍ය ආදායම




## රාජ්‍ය වියදම




## රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි.යේ % ලෙස)




*ප්‍රාථමික ශේෂයෙන් පොලී වියදම අඩු කළ විට, සමස්ත අයවැය ශේෂයට සමාන වේ.

- බදු ප්‍රතිසංස්කරණ රාජ්‍ය ආදායම ඉහළ නැංවීය
- පොලී වියදම ඉහළ මට්ටමක පැවතියත් වියදම් තාර්කිකරණ ක්‍රියාමාර්ග හරහා රජයේ වියදම යම්කිසි මට්ටමක පාලනයකට යටත්ව තබා ගැනීමට හැකි විය
- වසර 5කට පසුව සහ 1950 සිට ගත් කළ හයවන වතාවට ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කර ඇත


*මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව*

# 2023 වසරේ දී, මධ්‍යම රජයේ නොපියවූ ණය ද.දේ.නි.යේ %ක් ලෙස අඩු වූ අතර දේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ ගියේය...

ද.දේ.නි.යේ ඇති වූ කැපී පෙනෙන වර්ධනය සහ රුපියලේ අගය ඉහළ යෑම නිසා විදේශ ණය මත ඇතිවූ බලපෑම හේතුවෙන්, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ නොපියවූ ණය අගය පහත වැටුණි


මූලික වශයෙන් දේශීය පොලී ගෙවීම් වැඩි වීම හේතුවෙන්, 2023 වසරේ දී මුළු ණය සේවාකරණ ගෙවීම් ඉහළ ගියේය

**මධ්‍යම රජයේ නොපියවූ ණය (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)**





මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)**





මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව




# සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

# ඇතැම් අවස්ථාවන්හි දී යම් විචලනයන් සිදුවිය හැකි වුවද, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත 5%ක මට්ටම ආසන්නයේ ස්ථායි වනු ඇතැයි අපේක්ෂා කෙරේ...

**කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනයේ පුරෝකථන**
**(කාර්තුමය සාමාන්‍ය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




## පුරෝකථනවලට සාපේක්ෂව උද්ධමනය ඉහළ යෑමේ අවදානම්

- ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන් ඉහළ යෑම
- අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් සිදුවන බලපෑම
- විදුලි ගාස්තු ඉහළ නැංවීම

## පුරෝකථනවලට සාපේක්ෂව උද්ධමනය පහළ යෑමේ අවදානම්

- සැපයුම් තත්ත්වයන් ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම
- මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීම

මතුපිට උද්ධමනය හා සමගාමීව මූලික උද්ධමනය ද මැදි කාලීනව 5%ක මට්ටමේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ

# කෙටි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන

| දර්ශකය | ඒකකය | 2022 | 2023 | පුරෝකථන 2024 |
|---|---|---|---|---|
| මූර්ත ද.දේ.නි. වර්ධනය | % | -7.3 | -2.3 | 3.0 |
| වෙළඳ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.7 | -5.8 | -7.8 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.9 | 1.8 | 0.5 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 1.2 | 3.1 | 3.4 |
| ප්‍රාථමික ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.7 | 0.6 | 0.8 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -10.2 | -8.3 | -7.3 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය | % | 6.2 | -0.6 | 8.5 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය | % | 46.4 | 17.4 | 5.0 |

# මුදල් සහ විදේශීය අංශයේ ඉදිරි දැක්ම...

## මුදල්

- මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
- වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් සාමාන්‍යකරණය වනු ඇත
- බැංකු අංශය විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි දක්නට ලැබුණු ප්‍රසාරණය, අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
- රාජ්‍ය අංශයට බැංකු අංශයේ නිරාවරණය වීම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යනු ඇත
- පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය 2024 වසරේ දී සියයට 15.0ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ

## විදේශීය අංශය

- ආනයන ඉල්ලුම ඉහළ යාම සහ අපනයන ආදායමේ මධ්‍යස්ථ වර්ධනය සමඟ 2024 වසරේ දී වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- සංචාරක ව්‍යාපාරයේ සහ අනෙකුත් සේවා අපනයනවල අපේක්ෂිත වර්ධනයත් සමඟ සේවා ගිණුමේ අතිරික්තය වැඩි වනු ඇත
- 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, පසුව එය ක්‍රමයෙන් පුළුල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
- ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂාවන්, බහුපාර්ශ්වික ආයතන මගින් ලැබෙන විදේශීය මූල්‍යන සහාය සහ විදේශීය සෘජු ආයෝජන මගින් මූල්‍ය ගිණුම් වෙත වන ලැබීම්වලට සහාය ලැබෙනු ඇත
- වෙළඳපොළ තත්ත්වයන්ට අනුව තීරණය වන විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම සහ සංචිත ගොඩනැගීම

# මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම...

**මූල්‍ය**

- මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ
  - *අපේක්ෂිත ණය වර්ධනය හා වෙළඳාම සම්බන්ධයෙන් පවතින සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීම තුළින් බැංකු අංශයේ ණය ගුණාත්මකභාවය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ*
- මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීම සඳහා ව්‍යුහාත්මක, නෛතික සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ සහ නවෝත්පාදන මාලාවක් අඛණ්ඩව ක්‍රියාවට නංවනු ඇත
- මනා අනුපිළිවෙලක් සහිත ස්ථාවර ප්‍රතිපත්ති කාලීනව ක්‍රියාත්මක කිරීම
  - *ජා.මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩපිළිවෙළට අනුකූලව මූල්‍ය අංශයේ අඩුපාඩු හා දුර්වලතා විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ*

**රාජ්‍ය මූල්‍ය**

- ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කෙරෙනු ඇත
- ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා සුදුසු ප්‍රතිපාදන ලබා දීම මගින් වියදම් කළමනාකරණය
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රසම්පාදනයට සම්බන්ධ නව නීති හඳුන්වා දීම
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීම
- ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙන අතර එමගින් ණය ගමන්පථය තිරසාර මට්ටමකට ගෙන ඒමට අපේක්ෂා කෙරේ
- රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් දිගුකාලීනව මුහුණ දුන් ගැටලුවලට පිළියම් යෙදීම සහ අනෙකුත් දූෂණ සහ විනිවිදභාවයේ දුර්වලතාවලට අදාළ ගැටලු නිරාකරණය කිරීම

# විශේෂ සටහන් ලැයිස්තුව...

1. සැපයුම් අංශයේ උද්ධමනය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තියට වන බලපෑම
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන - ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක්
3. තිරසාර ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම
4. වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය: මූල්‍ය පද්ධතියේ විශ්වාසය පවත්වා ගැනීම
5. ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028): මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක් කරා
6. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් වූ අන්‍යෝන්‍ය ඇගයීම 2025: එහි ජාතික වැදගත්කම
7. ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුමෙහි ප්‍රවණතා වඩාත් තිරසාර කිරීම

# සමාප්ති සටහන්...

- නිදහසෙන් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑමෙන් අනතුරුව 2023 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය
- 2022 වසරේ දී වාර්තා වූ ඉහළම උද්ධමන මට්ටම්වල සිට, 2023 වසර අවසානය වනවිට උද්ධමනය තනි ඉලක්කමක මට්ටමට පාලනය විය
- 2023 වසරේ ජූනි මාසයේ සිට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් වෙත යොමු වූ අතර මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමත් සමඟ දේශීය වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය
- විනිමය අනුපාතිකය තීරණය වීමේ දී ඉහළ නම්‍යශීලීත්වයක් සඳහා ඉඩ හැරීම සහ විදේශ විනිමය ගනුදෙනු මත පනවා තිබූ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම හේතුවෙන් 2023 සහ 2024 වසරේ මුල් කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය
- ජාත්‍යන්තර සංචිත ඉහළ නංවමින් වසර තුළ දී විදේශීය ස්වාරක්ෂක ක්‍රමයෙන් නැවත වර්ධනය විය
- විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ග පිළිබඳව මහ බැංකුව මූල්‍ය අංශය වෙත මාර්ගෝපදේශ සැපයූ අතර, එමගින් දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ආරක්ෂා කෙරිණි
- 2023 වසරේ දී රජයේ ප්‍රාථමික ශේෂයේ සහ විදේශීය ජංගම ගිණුමේ අතිරික්ත වාර්තා විය

# සමාප්ති සටහන්...


- ඉදිරියේදී ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍ර තුළ පුළුල් ආර්ථික වර්ධනයක් බලාපොරොත්තු වේ
- මහ බැංකුවේ ඉහළ ස්වාධීනත්වය මෙන්ම මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම තහනම් වීම හරහා දේශීය මිල ස්ථායිතාව ආරක්ෂාවනු ඇත
- විදේශීය අංශයේ ස්ථායිතාව පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ
- මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වර්ධනය වනු ඇත
- රජය විසින් සිය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න ඉදිරියට ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ

...මේ දක්වා ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම මත ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම රඳා පවතින අතර, මෙම ක්‍රියාවලියෙහි ම කොටසක් ලෙස ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඉතා වැදගත් වේ...

**...රට සම්පූර්ණයෙන් ම අර්බුදයෙන් ඉවත් වී නොමැති බැවින්, අධික පිරිවැයක් සහිත ප්‍රතිපත්ති අත්හදා බැලීම් සිදු කිරීම ඇතුළුව සැලසුම්ගත මාර්ගයෙන් ඉවත් වීම සඳහා කිසිදු අවකාශයක් නොමැත...**

...ශක්තිමත් ආයතනික සැකැස්මක් සහ නීතිමය රාමුවක් ගොඩනැගීම නව සාමාන්‍යයක් කරා ආර්ථික සංක්‍රමණයට සහාය වනු ඇති අතර, ව්‍යුහාත්මක ගැටලු ස්ථිර වශයෙන් විසඳීම සහ ප්‍රතිපත්ති ආපසු හැරවීම හා ඒ හේතුවෙන් නැවත නැවත ඇතිවන ආර්ථික පසුබෑම් වළක්වා ගැනීම සඳහා පුළුල් දේශපාලනික සහ සමාජයීය එකඟතාවක් මත ආර්ථික ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අතිශයින් තීරණාත්මක වන අතර, තිරසාර වර්ධනයක් තුළින් පොදු ජනතාවගේ සුබසාධනය ඉහළ නැංවීම එමගින් සහතික කෙරෙනු ඇත...

...දේශීය මිල ස්ථායිතාව, විදේශීය අංශයේ ස්ථායිතාව සහ මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටින අතර, එමගින් ස්ථිරසාර ආර්ථික ස්ථායිතාව සහ ස්ථිරසාර ආර්ථික වර්ධනයට සහාය සලසනු ඇත...




# ස්තූතියි